# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,010 - 2017 මාර්තු මස 10 වැනි සිකුරාදා - 2017.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 636 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 655 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 මාර්තු මස 31 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


635- B 81151 — 5,403 (2017/03)
F 1 -

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(2) උප වගන්තියට අනුව නිකුත් කරන දැන්වීම

පහත සඳහන් කර ඇති ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතිවල ඈවර කටයුතු අවසන් කර ඇති බව එම ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතිවල සියලුම සාමාජිකයින්ට, ණය හිමියන්ට හා ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(2) උප වගන්තියට අනුව මෙයින් දන්වා සිටිමි. පහත සඳහන් කර ඇති ලියාපදිංචිය අවලංගු කළ යම් සමුපකාර සමිතියකින් තමන්ට ලැබිය යුතු යම් හිමිකමක් තිබේ නම්, මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (අති විශෙෂ) පල කළ දිනයේ සිට මාස 03 ක් ඇතුලත එම හිමිකම් ඉල්ලා සිටීම සිදුකළ යුතු බවට ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට, ලියාපදිංචිය අවලංගු කළ සමුපකාර සමිතියේ සාමාජිකයින්ට හා ණය හිමියන්ට මෙයින් දන්වමි. මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පලකළ දිනයේ සිට මාස 03ක් ගත වූ පසු ඉදිරිපත් කරන කිසිම හිමිකම් කියාපෑමක් පිළිබඳව සලකා නොබලන බවද දන්වා සිටිමි.

### කුරුණෑගල කොට්ඨාසය

| *අනු. අංකය* | *පෙර තිබූ ලි. ප. අංකය* | *සමිතියේ නම* | *වසා දමන ලද දිනය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|
| 01 | කු/618 | අව සී/ස කැප්පිටිවලාන වඩු කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය | 2015.12.07 | කුරුණෑගල |
| 02 | වප/කු/225 | අව සී/ස වීරේ කාන්තා ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2015.12.07 | කුරුණෑගල |
| 03 | කු/1581 | අව සී/ස උඩපොල වඩු කාර්මික සමුපකාර සමිතිය | 2015.12.07 | කුරුණෑගල |
| 04 | වප/කු/ව/6 | අව සී/ර නෑබඩවැව බ්‍රාහ්මණගම සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2015.12.07 | කුරුණෑගල |
| 05 | වප/කු/349 | අව සී/ස පහල අඹාලේ ප්‍රතිභා කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2015.12.08 | කුරුණෑගල |
| 06 | වප/කු/512 | අව සී/ස පිටලේවැව කෘෂි නිෂ්පාදන සමුපකාර සමිතිය | 2015.12.08 | කුරුණෑගල |
| 07 | කු/1979 | සී/ස ජයරාජ මහ විදුහල් සමුපකාර සමිතිය | 2015.12.08 | කුරුණෑගල |
| 08 | වප/කු/169 | අව සී/ස මාවත්ත ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2015.12.07 | කුරුණෑගල |
| 09 | වප/කු/122 | අව සී/ස මාලගමුව කාන්තා ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2015.12.08 | කුරුණෑගල |
| 10 | කු/2109 | අව සී/ස වන්නිකුඩාවැව මහාවිද්‍යාලයේ පාසල් සමුපකාර සමිතිය | 2015.12.08 | කුරුණෑගල |
| 11 | කු/2108 | අව සී/ස රාජංගනය යාය 5 සෝලේ මහා විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය | 2016.02.27 | කුරුණෑගල |
| 12 | වප/කු/321 | අව සී/ස කුඩා උයන්ගල්ල ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2016.03.03 | කුරුණෑගල |
| 13 | කු/1923 | අව සී/ර මීගලෑව සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.03.17 | කුරුණෑගල |
| 14 | වප/කු/179 | අව සී/ස කටුපිටිය එකමුතු ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2016.03.17 | කුරුණෑගල |
| 15 | වප/කු/61 | අව සී/ස නෑඹිලිකුඹුර ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.03.23 | කුරුණෑගල |
| 16 | කු/2013 | අව සී/ස මහානාන්නේරිය මහා විද්‍යාලීය සමුපකාර සමිතිය | 2016.03.17 | කුරුණෑගල |
| 17 | කුලි/331 | අව සී/ර ඉමියන්ගොඩ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.04.06 | කුරුණෑගල |
| 18 | වප/කු/488 | අව සී/ස මාමුණුව රජගහ මල් වවන්නන්ගේ සමුපකාර සමිතිය | 2016.04.06 | කුරුණෑගල |
| 19 | වප/කු/නා/03 | අව සී/ස නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුකුළන් ඇති කරන්නන්ගේ සමුපකාර සමිතිය | 2016.04.06 | කුරුණෑගල |
| 20 | වප/කු/23 | අව සී/ස හෙට්ටිගම ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.04.06 | කුරුණෑගල |
| 21 | කු/2012 | අව/සී/ස දිඹුලාගල මහා විද්‍යාල සමුපකාර සමිතිය | 2016.04.06 | කුරුණෑගල |
| 22 | වප/කු/304 | අව සී/ස රත්මල්ගොඩ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2016.04.06 | කුරුණෑගල |
| 23 | වප/කු/177 | අව සී/ස ගෝවාකොටුව ප්‍රගති ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.04.12 | කුරුණෑගල |
| 24 | වප/කු/256 | අව සී/ස දොරටියාව විශාඛා කාන්තා ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.04.12 | කුරුණෑගල |

| අනු. අංකය | පෙර තිබූ ලි. ප. අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 25 | වප/කු/104 | අව සී/ස වේදිනිගම ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.04.20 | කුරුණෑගල |
| 26 | කු/1486 | අව සී/ර කොබ්බෑවැහැර සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.04.20 | කුරුණෑගල |
| 27 | වප/කු/36 | අව සී/ස ඇලවක ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.04.20 | කුරුණෑගල |
| 28 | වප/කු/206 | අව සී/ස කරඳවැටිය ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.04.27 | කුරුණෑගල |
| 29 | වප/කුලි/32 | අව සී/ස මිල්ලගොඩ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.04.29 | කුරුණෑගල |
| 30 | වප/කු/83 | අව සී/ස තිලකපුර ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.05.19 | කුරුණෑගල |
| 31 | වප/කු/24 | අව සී/ස උදානගම ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2016.05.25 | කුරුණෑගල |
| 32 | වප/කු/පො/08 | අව සී/ර යාපහුව කෘෂි ළිං අතුරුභෝග නිෂ්පාදන සමුපකාර සමිතිය | 2016.06.07 | කුරුණෑගල |
| 33 | වප/නික/05 | අව සී/ස නිකවැරටිය ආදර්ශ මුස්ලිම් මහා විද්‍යාලීය සමුපකාර සමිතිය | 2016.06.07 | කුරුණෑගල |
| 34 | කු/1620 | අව සී/ස සියඹලන්ගමුව සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.06.07 | කුරුණෑගල |
| 35 | වප/කු/207 | අව සී/ස නාරම්මල සැනසුම ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2016.06.07 | කුරුණෑගල |
| 36 | වප/කු/47 | අව සී/ස හිද්දන විජය ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2016.06.07 | කුරුණෑගල |
| 37 | වප/කු/112 | අව සී/ස කිරිදිගල්ල නිර්මාණ ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.06.13 | කුරුණෑගල |
| 38 | කුලි/406 | අව සී/ර පානකඩුව පැරකුම් සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.06.13 | කුරුණෑගල |
| 39 | වප/කු/173 | අව සී/ස පහළ වැත්තෑවකන්ද එකමුතු ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2016.06.13 | කුරුණෑගල |
| 40 | වප/කු/293 | අව සී/ස වීරඹුගෙදර කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2016.06.13 | කුරුණෑගල |
| 41 | කු/වප/63 | අව සී/ස අන්දරවැව ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමිතිය | 2016.07.15 | කුරුණෑගල |
| 42 | වප/කු/පො/19 | අව සී/ස අමුණුගම නිජබිම ස්වශක්ති පදනම සමුපකාර සමිතිය | 2016.08.25 | කුරුණෑගල |
| 43 | වප/කුරු/12 | අව සී/ස කුරුණෑගල මාවත්ත ස්වශක්ති පදනම සමුපකාර සමිතිය | 2016.08.30 | කුරුණෑගල |
| 44 | වප/කු/305 | අව සී/ස බෝයගනේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2016.09.09 | කුරුණෑගල |
| 45 | වප/කු/191 | අව සී/ස මුරුතව ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2016.09.27 | කුරුණෑගල |
| 46 | වප/කු/287 | අව සී/ස ගලගෙදරගම එකමුතු කාන්තා ස්වශක්ති සමුපකාර සමිතිය | 2016.09.27 | කුරුණෑගල |
| 47 | කේ. 31 | අව සී/ර කොළඹලාමුල්ල සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.11.17 | කුරුණෑගල |
| 48 | වප/කු/156 | අව සී/ස රාජංගන ජලාශයේ ධීවර සමුපකාර සමිතිය | 2016.11.17 | කුරුණෑගල |
| 49 | කු/1518 | අව සී/ස දොඩම්ගස්ලන්ද මධ්‍ය මහා විද්‍යාලයේ පාසල් සමුපකාර සමිතිය | 2016.11.17 | කුරුණෑගල |
| 50 | කු/2034 | අව සී/ස ගල්/පාළුව විද්‍යාදීප විද්‍යාලයේ සමුපකාර සමිතිය | 2016.11.17 | කුරුණෑගල |

**කුලියාපිටිය කොට්ඨාසය**

| | | | | |
|---|---|---|---|---|
| 51 | වප/කුලි/17 | අව සී/ස ගල්පොල ජනපදය ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිතිය | 2015.11.19 | කුලියාපිටිය |
| 52 | වප/කු/පන්/13 | අව සී/ස පැතිගොඩගෙදර නිජබිම ස්වශක්ති පදනම සමුපකාර සමිතිය | 2015.11.19 | කුලියාපිටිය |
| 53 | වප/කුලි/82 | අව සී/ස හබරවැව සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | 2015.11.19 | කුලියාපිටිය |
| 54 | කුලි/59 | අව සී/ස ගිරිඋල්ල සමුපකාර නගර බැංකුව | 2015.11.19 | කුලියාපිටිය |
| 55 | වප/කු/කො/19 | අව සී/ස සමඟිගම ස්වශක්ති පදනම සමුපකාර සමිතිය | 2016.01.13 | කුලියාපිටිය |
| 56 | කුලි/371 | අව සී/ර කොස්වත්ත හේන්යාය සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.01.19 | කුලියාපිටිය |
| 57 | කුලි/212 | අව සී/ස බෝවත්ත කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2016.04.06 | කුලියාපිටිය |
| 58 | කුලි/367 | අව සී/ර පනාපිටිය එකමුතු සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.04.06 | කුලියාපිටිය |
| 59 | වප/කු/කො/07 | අව සී/ස නිජබිම ස්වශක්ති පදනම හිරිගොල්ල සමුපකාර සමිතිය | 2016.04.06 | කුලියාපිටිය |
| 60 | කුලි/369 | අව සී/ර කඳත්තාව කරුණානිධි සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | | කුලියාපිටිය |
| 61 | කුලි/303 | අව සී/ර වඩුගෙදර සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.05.13 | කුලියාපිටිය |

| අනු. අංකය | පෙර තිබූ ලි. ප. අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 62 | කු/1656 | අව සී/ර බලදොර සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.05.13 | කුලියාපිටිය |
| 63 | කු/1605 | අව සී/ර මැල්ලැගස්වැව සකසුරවැම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.05.13 | කුලියාපිටිය |
| 64 | කුලි/434 | අව සී/ර තාවල්ල සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.06.01 | කුලියාපිටිය |
| 65. | කුලි/314 | අව සී/ර කොවුල්වැව පළාත සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.06.01 | කුලියාපිටිය |
| 66 | කු/392 | අව සී/ර කෙළිනාවල සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.06.01 | කුලියාපිටිය |
| 67 | කුලි/219 | අව සී/ස කන්දෙටිය ගොවීන්ගේ ගොවි කර්මාන්ත හා කර්මාන්ත සමුපකාර සමිතිය | 2016.06.01 | කුලියාපිටිය |
| 68 | වප/කුලි/157 | අව සී/ස බෝහිංගමුව සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | 2016.06.27 | කුලියාපිටිය |
| 69 | වප/කු/පන්/19 | අව සී/ස ඇලබඩගම උතුර ස්වශක්ති පදනම සමුපකාර සමිතිය | 2016.06.27 | කුලියාපිටිය |
| 70 | කුලි/73 | අව සී/ස කුලියාපිටිය කනිෂ්ඨ විශ්වවිද්‍යාලයීය නිලධාරින්ගේ සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.06.27 | කුලියාපිටිය |
| 71 | වප/කුලි/19 | අව සී/ස වඩුගෙදර නාරංගල්ල ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.06.29 | කුලියාපිටිය |
| 72 | වප/කු/පො/116 | අව සී/ර මඩඉන සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.06.29 | කුලියාපිටිය |
| 73 | වප/කු/කො/33 | අව සී/ස අලහේන්ගම විශාඛා ස්වශක්ති සමුපකාර සමිතිය | 2016.06.30 | කුලියාපිටිය |
| 74 | කුලි/295 | අව සී/ර බරිගොඩ සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.08.26 | කුලියාපිටිය |
| 75 | වප/කු/පො/37 | අව සී/ස නිජබිම ස්වශක්ති උස්වැව නැගෙනහිර සමුපකාර සමිතිය | 2016.08.26 | කුලියාපිටිය |
| 76 | වප/කු/පො/30 | අව සී/ස වඩුමුන්න ශ්‍රීපාලි ස්වශක්ති පදනම් සමුපකාර සමිතිය | 2016.08.26 | කුලියාපිටිය |
| 77 | කු/1642 | අව සී/ර මිදෙල්ලව සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.08.26 | කුලියාපිටිය |
| 78 | කුලි/390 | අව සී/ර හෙට්ටිරිප්පුව සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.07.05 | කුලියාපිටිය |
| 79 | කු/2051 | අව සී/ස හෙන්ඩියාගල රතනපාල මහා විද්‍යාලීය සමුපකාර සමිතිය | 2016.10.05 | කුලියාපිටිය |
| 80 | වප/කුලි/08 | අව සී/ස කිතලව පූගල්ල පුබුදු එක්සත් සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | | කුලියාපිටිය |
| 81 | ව/ප/කු/කො/03 | අව සී/ස බැද්දේගම වයඹ ස්වශක්ති පදනම සමුපකාර සමිතිය | 2016.11.16 | කුලියාපිටිය |

**හලාවත කොට්ඨාසය**

| | | | | |
|---|---|---|---|---|
| 82 | හලා/494 | අව සී/ර මුදුකටුව ශක්ති සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.04.06 | හලාවත |
| 83 | හලා/481 | අව සී/ර මානුවංගම සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.04.06 | හලාවත |
| 84 | වප/නව/09 | අව සී/ස වෙලේවැව දකුණ නිජබිම දිරිය පෙරට සමුපකාර සමිතිය | 2016.04.06 | හලාවත |
| 85 | වප/පු/නා/01 | අව සී/ස නාත්තන්ඩිය ධම්මස්සර මධ්‍ය මහා විද්‍යාලීය පාසල් සමුපකාර සමිතිය | 2016.04.06 | හලාවත |
| 86 | හලා/520 | අව සී/ර නැගෙනහිර ලුණුවිල සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.04.12 | හලාවත |
| 87 | හලා/643 | අව සී/ස වෙල්ලන්කරේ ගොවි ද්‍රව්‍ය නිපදවන්න්ගේ හා අලෙවි කරන්නන්ගේ සමුපකාර සමිතිය | 2016.04.26 | හලාවත |
| 88 | NT 111 | අව සී/ස බොරලැස්ස මැටි කර්මාන්තකරුවන්ගේ සමුපකාර සමිතිය | 2016.04.29 | හලාවත |
| 89 | හලා/555 | අව සී/ර ඌරුලියාගාර සකසුවරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.05.13 | හලාවත |
| 90 | හලා/588 | අව සී/ර අඹකඳවිල ශුද්ධ වූ රෝගුස් සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.05.25 | හලාවත |

| අනු. අංකය | පෙර තිබූ ලි. ප. අංකය | සමිතියේ නම | වසා දමන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 91 | හලා/659 | අව සී/ස ආචේමරියා ධීවර සමුපකාර සමිතිය | 2016.05.25 | හලාවත |
| 92 | හලා/841 | අව සී/ස පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉස්සන් වගා කරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ සමුපකාර සමිතිය | 2016.05.25 | හලාවත |
| 93 | වප/පු/කරු/06 | අව සී/ස ස්වශක්ති පදනම තේනුවර කාන්තා සමුපකාර සමිතිය | 2016.05.31 | හලාවත |
| 94 | වප/නව/16 | අව සී/ස වෙලේවැව උතුර නිජබිම දිරිය පෙරට සමුපකාර සමිතිය | 2015.12.22 | හලාවත |
| 95 | හලා/668 | අව සී/ර ශාන්ත අන්තෝනි එක්සත් පල්ලියවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ධීවර සමුපකාර සමිතිය | 2016.06.30 | හලාවත |
| 96 | වප/පු/මා/12 | අව සී/ස කාකුපඩියාව ඉසුරු ස්වශක්ති කාන්තා සමුපකාර සමිතිය | 2016.06.30 | හලාවත |
| 97 | හලා/505 | අව සී/ස වඩිගමංගාව සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2016.07.27 | හලාවත |
| 98 | NWP/CH/AC/ 959 | අව සී/ස රාල්මඩුව කර්මාන්ත සංවර්ධන සමුපකාර සමිතිය | 2016.10.30 | හලාවත |
| 99 | හලා/822 | අව සී/ස පුත්තලම් දිස්ත්‍රික් උඩවැඩියා මල් හා විසිතුරු පැලෑටි අපනයනය සඳහා වගා කරන්නන්ගේ සමුපකාර සමිතිය | 2016.10.27 | හලාවත |
| 100. | NWP/CH/AC/ 963 | අව සී/ස ලිහිරියාගම එකමුතු සත්කාර්ය ස්වශක්ති සමුපකාර සමිතිය | 2016.11.17 | හලාවත |

කමල් අමරසිංහ,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/
රෙජිස්ට්‍රාර් (වයඹ).

2017 පෙබරවාරි මස 15 වැනි දින,
වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පළමු මහල,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

03-247

---

**වයඹ පළාත් සභාව**

**වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක ........ දරන වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය**

මෙහි පහත පළකරන වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක.............. දරන වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය අද දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසුව වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳ ඉදිරිපත් කිරීමට යම් කරුණක් ඇතොත් එය එදිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ලක්ෂ්මන් වේඩරුව,
අමාත්‍ය,
වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,
සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා,
කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය.

වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,
සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා,
කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය.
3 වෙනි මහල,
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක ........ දරන වයඹ පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය**

දීර්ඝ නාමය.

වයඹ පළාත තුළ දේශීය වෛද්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලා සහ රෝහල් පිහිටුවීම, එවැනි බෙහෙත් ශාලාවලට සහ රෝහල්වලට ආධාර මුදල් ලබාදීම, ඖෂධ උද්‍යාන පිහිටුවා පවත්වාගෙන යාම, එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කරවීම සහ මෙහෙයවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීම පිණිස හා ඊට අනුෂාංගික කරුණු පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

මෙහි විධිවිධාන සලසා ඇති ප්‍රමාණයට 1961 අංක 31 දරන ආයුර්වේද පනත අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක ...... දරන වයඹ පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රඥප්තියේ අරමුණු.

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

(1) වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවීම හා පවත්වාගෙන යාමට අදාළ විධිවිධාන සැලැස්වීම.

(2) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව වයඹ පළාතේ දේශීය වෛද්‍ය කටයුතුවලට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම.

(3) දේශීය වෛද්‍ය කටයුතු සඳහා වන උපදේශක මණ්ඩලයක් පිහිටුවීම හා පළාත් බද වෛද්‍ය පර්යේෂණ පහසුකම් සැපයීම.

(4) ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටු හා ආයුර්වේද සංරක්ෂණ සභා පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(5) ආයුර්වේද, සිද්ධ, යුනානි හා පාරම්පරික යන දේශීය වෛද්‍ය ක්‍රම වයඹ පළාත තුළ පවත්වාගෙන යාම, සංරක්ෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

(6) ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා සහ රෝහල් පිහිටුවීම, පවත්වාගෙන යාම හා පහසුකම් සැලසීම.

(7) ඖෂධ උද්‍යාන පිහිටුවීම, දේශීය හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා ඒ සඳහා නිෂ්පාදනාගාර පවත්වාගෙන යාම,

(8) දේශීය වෛද්‍ය කටයුතු ප්‍රවර්ධනය හා නියාමනය කිරීම උදෙසා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගලයින් සම්බන්ධීකරණය කර ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම.

## I වන කොටස

### පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවීම, බලතල, සංයුතිය හා කාර්යභාරය

පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවීම.

3. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකිරීම සඳහා මෙහි මින්මතු ''දෙපාර්තමේන්තුව'' යනුවෙන් හඳුන්වනු ලබන ''වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව'' පිහිටුවිය යුතු වන්නේ ය.

කොමසාරිස්වරයා පත් කිරීම හා දෙපාර්තමේන්තු- වේ සංයුතිය.

4. (1) මෙම ප්‍රඥප්තියේ බලතල, විධිවිධාන හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ''පළාත් ආයුර්වේද කොමසාරිස්'' යනුවෙන් හඳුන්වනු ලබන ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් ලැබූ ආයුර්වේද වෛද්‍ය නිලධාරියෙකු ආයුර්වේද ව්‍යවස්ථාවට අනුකූලව පත්කල යුතු වන්නේ ය.

(2) කොමසාරිස්වරයාට සහාය පිණිස පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්ක දෙක සඳහා අවශ්‍ය වන්නා වූ නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන්, ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්, සෙසු කාර්ය මණ්ඩලයෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු වන්නේ ය.

(3) මෙම ප්‍රඥප්තියේ කොමසාරිස්වරයා වෙත පැවරෙන බලතල හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරුන්, සහකාර කොමසාරිස්වරුන්, ප්‍රජා සෞඛ්‍ය අධීක්ෂණ නිලධාරීන්, ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය සහකාරවරුන් හා සෙසු නිලධාරීන් වෙත කොමසාරිස්වරයා විසින් ස්වකීය බලතල පැවරිය හැක්කේ ය.

(4) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු දරන්නා සියලුම නිලධාරීන්, සේවකයින් ඔවුන් දැනට පවතින සේවා තත්ත්වය මත මෙම ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලැබුවා සේ සැලකිය යුතු වන්නේ ය.

(5) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත්කරනු ලබන සියලුම නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ නිලධාරීන් වශයෙන් සැලකිය යුතු වන්නේ ය.

5. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය.

(1) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමෙන් අනතුරුව හා අනුමත කරන ලද එකී සංවර්ධන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම උපරිම ඵලදායීත්වයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම.

(2) පළාත් ආයුර්වේද රෝහල්, දිස්ත්‍රික් ආයුර්වේද රෝහල්, ආයුර්වේද මූලික රෝහල්, ග්‍රාමීය ආයුර්වේද රෝහල්, ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා, ආයුර්වේද සායන මධ්‍යස්ථාන ආයුර්වේද ප්‍රවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම, පරිපාලනය හා පවත්වාගෙන යාම සහ ප්‍රතිකාර සේවා සැපයීම.

(3) මහජන සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍යවන ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම.

(4) රෝග නිවාරණය සඳහා සෞඛ්‍ය අධ්‍යාපනය, ප්‍රජා සෞඛ්‍ය සේවා කටයුතු ක්‍රියාත්මක කිරීම.

(5) රෝගීන් සඳහා ගුණාත්මක, කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ඉටුකිරීමට වගබලා ගැනීම.

(6) පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ප්‍රචලිත කිරීම, විශේෂ අවස්ථාවල දී විශේෂ හැකියාවන් තිබෙන පාරම්පරික දේශීය වෛද්‍යවරුන්ගේ සේවය ලබාගැනීම.

(7) දේශීය හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සඳහා ඔසු වගාවන්, ඔසු උයන්, ඔසු තවාන් පවත්වාගෙන යාම, නඩත්තුව, අවශ්‍ය පහසුකම් හා උපදෙස් සැපයීම, දේශීය හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය දිරිමත් කිරීම සහ නියාමනය.

(8) පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් නොවන දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් රෝහල්, බෙහෙත් ශාලා, ඖෂධ නිෂ්පාදනාගාර හෝ දේශීය වෛද්‍ය ක්‍රමයට ගැනෙන්නා වූ රසායනාගාර, සේවා මධ්‍යස්ථාන හෝ ඊට අනුශාංගික ආයතන ලියාපදිංචි කිරීම, ඖෂධ ගබඩා හා ඖෂධ අලෙවිසැල් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම සහ අධීක්ෂණය කිරීම හා අවශ්‍ය අවස්ථාවල අදාළ ආයතනයන්ට ප්‍රවේශ වීම හා පරීක්ෂා කිරීම.

(9) ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටු සහ ආයුර්වේද සංරක්ෂණ සභා පිහිටුවා පවත්වාගෙන යාම.

(10) ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටු සහ ආයුර්වේද සංරක්ෂණ සභා මගින් ඉදිරිපත් වන යෝජනා අනුමැතිය ලබාදීම සඳහා සලකා බැලීම.

(11) දේශීය වෛද්‍ය සේවා සැපයීම සඳහා ගාස්තු අයකරනු ලබන වාට්ටු පවත්වාගෙන යාම. එම වාට්ටු ස්වයං ආදායම් උත්පාදක ක්‍රමවේදයක් මගින් පාලනය වීම.

(12) දේශීය හා විදේශීය සංචාරකයින්ට දේශීය වෛද්‍ය ක්‍රම හඳුන්වාදීම හා ප්‍රචලිත කිරීම.

(13) දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනයට වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(14) ලියාපදිංචි දේශීය වෛද්‍යවරුන්ට අවශ්‍ය රසෞෂධ හා අන්තරායකාරී ඖෂධ නිකුත් කිරීම හා නිර්දේශ ලබාදීම.

(15) දේශීය හා ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යාම.

(16) ආයුර්වේද ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සහ ගුණාත්මක රෝගී සත්කාරක සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන පර්යේෂණ කටයුතු ඉටු කිරීම සඳහා ද ආයුර්වේද පළාත් බද පර්යේෂණ මණ්ඩලයක් ස්ථාපිත කොට පවත්වාගෙන යා හැක්කේ ය.

(17) දේශීය වෛද්‍ය සිසුන් පුහුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(18) ජාතික වෘත්තීය නිපුණතා (NVQ) මට්ටමේ පුහුණු පාඨමාලා පැවැත්වීම හා සහතික නිකුත් කිරීම.

(19) ආයුර්වේද ක්ෂේත්‍රයට අදාළ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.

(20) නිෂ්පාදිත ඖෂධවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ප්‍රමිති අංශයක් පිහිටුවීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

පළාත්.

6. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් අරමුණු හා කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු, වාර්තා කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධරයකු විසින් යම් ආයතනයකින් හෝ පුද්ගලයකු වෙතින් ඉල්ලා සිටිය හොත්, ඔහු විසින් හෝ එම ආයතනය විසින් එම තොරතුරු ලබාදිය යුතු වන්නේ ය.

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන යම් නිලධරයකුට හෝ කලින් දැනුම්දීමකින් හෝ දැනුම්දීමකින් තොරව ඕනෑම වේලාවක වයඹ පළාත තුළ ඇති දේශීය වෛද්‍ය මධ්‍යස්ථාන වෙත, දේශීය වෛද්‍ය සේවා සපයන ඕනෑම ආයතනයක් වෙත ඇතුල්වීමට, හා

(අ) යම් පරීක්ෂා කිරීමක්, විභාග කිරීමක්, විමර්ශනය කිරීමක්, සමීක්ෂණයක් පැවැත්වීමට,

(ආ) අවශ්‍ය විය හැකි ලිපිලේඛන පරීක්ෂා කිරීමට හෝ තොරතුරු ලබා ගැනීමට,

(ඇ) අවශ්‍ය ලිපිලේඛන භාරයට ගැනීම ඇතුලු ඕනෑම ක්‍රියාවක් කිරීමට බලය ඇත්තේ ය.

(ඈ) පළාත් පාලන ආයතනයක් වන කල්හි එහි ප්‍රධාන විධායක නිලධාරියා දැනුම්වත් කළ යුතු ය.

(3) අධිකරණයේ අවසරය අවශ්‍ය යම් රහසිගත තොරතුරු හැර ලේඛන හෝ වාර්තා පරීක්ෂා කිරීමට ඉහතින් වූ නිලධාරින්ට විශේෂයෙන් බලය පවරා ඇත්නම් මිස, රෝගියෙකුගේ වෛද්‍ය වාර්තා පරීක්ෂා කිරීමට යම් තැනැත්තෙකුට බලය පවරන ලෙස මෙම වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් වූ කිසිවකුත් ඉඩ ලැබුණ සේ සලකනු නොලැබිය යුත්තේ ය. *නැතහොත්* තේරුම් නොගත යුත්තේ ය.

## II වන කොටස

### ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කිරීම

7. ජාතික ප්‍රතිපත්තියට අනුකූලව වයඹ පළාත තුළ දේශීය වෛද්‍ය කටයුතුවලට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම පළාත් අමාත්‍යාංශය වෙත පැවරෙන්නේ ය. ඒ සඳහා පළාත තුළ ආයුර්වේද රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලාවලට අනුයුක්තව ස්ථාපිත කර ඇති රෝහල් සංවර්ධන කමිටුවල රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයන්ගෙන් යෝජනා ලබාගත හැකි වන්නේ ය. ප්‍රතිපත්ති සම්පාදනය.

8. පළාත තුළ ජනගහනය, යටිතල පහසුකම්, සමාජයීය හා අදාළවන අනෙකුත් සාධක හා නිර්ණායකයන් පදනම් කරගෙන පළාත් ආයුර්වේද සැලස්ම ආයුර්වේද කොමසාරිස් විසින් සකස් කර, ලේකම්වරයාගේ අනුමැතියට වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වන්නේ ය. සැලැසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

9. පළාතේ ජනතාවගේ සෞඛ්‍යය හා සනීපාරක්ෂාව සඳහා දේශීය වෛද්‍ය ක්‍රම උපයෝගී කර ගැනීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඒ සඳහා ජනතා නැඹුරුව වැඩි කරලීම, පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම හා සංරක්ෂණය කිරීම, ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා පිහිටුවීම හා පවත්වාගෙන යාම, ඔසු උයන් පිහිටුවීම හා පවත්වාගෙන යාම, දේශීය වෛද්‍ය ක්‍රම සඳහා අවශ්‍ය ඖෂධ නිෂ්පාදනය හා එහි කටයුතු සඳහා රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයින්ගේ දායකත්වය සෘජුව හෝ වක්‍රව ලබා ගැනීම ඇතුළුව දේශීය වෛද්‍ය කටයුතු හා සම්බන්ධ සේවාවන් මෙම ප්‍රඥප්තියේ අරමුණුවලට හා විධිවිධානයන්ට අනුකූලව, පළාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සැපයිය යුතු වන්නේ ය. සේවාවන් සැපයීම.

10. මෙම ප්‍රඥප්තියෙහි අරමුණු හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් නිකුත් කිරීම, මඟ පෙන්වීම හා නියෝග පැනවීම මෙහි මින්මතු "අමාත්‍යවරයා" යැයි හඳුන්වනු ලබන වයඹ පළාත් දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබිය හැකි වන්නේ ය. අමාත්‍යවරයාගේ බලතල.

11. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට නිකුත් කරනු ලබන නියෝග, උපදෙස් හා මඟ පෙන්වීම් යටතේ පළාත් ආයුර්වේද දේශීය වෛද්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, පළාත් දේශීය වෛද්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම සහ පාලනය පළාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේ ය. ලේකම්වරයාගේ බලතල.

12. මෙම ප්‍රඥප්තියෙ හි විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග යටතේ හෝ කිසියම් නිලධරයකු විසින් කරනු ලැබූ නියමයක් හෝ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැක්කේ ය. අමාත්‍යවරයාගේ නියමය පරිදි ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් පත්කරනු ලබන නිලධාරියෙකු විසින් හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඒ පිළිබඳව කරනු ලබන පරීක්ෂණයෙන් අනතුරුව, එම නියමය හෝ තීරණය ස්ථිර කිරීම හෝ සංශෝධනය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ අමාත්‍යවරයා විසින් කළ හැකි වන්නේ ය. අභියාචනා කිරීම.

13. පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්ක දෙක සඳහා නියෝජ්‍ය හෝ සහකාර කොමසාරිස් කාර්යාල පිහිටුවිය හැක්කේ ය. දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීම.

## III වන කොටස

### වයඹ පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය උපදේශක මණ්ඩලය

14. (1) දේශීය වෛද්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම ඇතුළු දේශීය වෛද්‍ය කාර්යභාරය ක්‍රියාවට නැංවීම පහසු කිරීම හා සහාය වීම පිණිස සාමාජිකයින් 15 ක ගෙන් සමන්විත වන මෙහි මින්මතු "උපදේශක මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන පළාත් දේශීය වෛද්‍ය උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කල යුතු වන්නේ ය. පළාත් දේශීය වෛද්‍ය උපදේශක මණ්ඩලය.

පළාත් දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයාට අවශ්‍ය උපදෙස් ලබාදීම සඳහා මෙම උපදේශක මණ්ඩලය පත් කරනු ලබන අතර, පළාත් දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ ය. පළාත් ආයුර්වේද කොමසාරිස් ලේකම්වරයා වන්නේ ය.

(2) උපදේශක මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින් පහත සඳහන් වේ.

(අ) වයඹ පළාත් පාලන කොමසාරිස්,

(ආ) වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

(ඇ) වයඹ පළාත් නීති අංශයේ නියෝජිතයෙක්,

(ඈ) වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,

(ඉ) ආයුර්වේද සංරක්ෂණ සභාවේ දිස්ත්‍රික් ආයුර්වේද සංරක්ෂණ සභා සභාපතිවරු දෙදෙනෙක්,

(ඊ) පළාත තුළ පරිපාලන දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි ප්‍රවීණ දේශීය වෛද්‍යවරු දෙදෙනෙක්,

(උ) දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව අත්දැකීම් හා පළපුරුද්ද ඇති නියෝජිතයින් තිදෙනෙක්.

(3) අවස්ථාවෝචිත පරිදි රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින් මෙම කමිටුව සඳහා නම්කර කැඳවා ගත හැකිය.

සාමාජිකයින් පත් කිරීම.

(4) ඉහත (14) (2) වගන්තියේ සඳහන් (අ) සිට (ඊ) දක්වා වන අයට නිල බලයෙන් සාමාජිකත්වය හිමි වන්නේ ය.

(5) ඉහත (14) (2) වගන්තියේ සඳහන් (උ) සිට (ඌ) යටතේ සඳහන් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබූ සාමාජිකයින් මින් මතු පත්කළ සාමාජිකයින් වශයෙන් හඳුන්වනු ලබන්නේ ය.

සාමාජික වීමට නුසුදුසුකම්.

(6) යම් තැනැත්තකු :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වී ඇත්නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ පත්කළ සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබීමට හෝ දිගටම සිටීමට නුසුදුස්සකු වන්නේ ය.

(ආ) සභාවේ සෑම පත්කළ සාමාජිකයකු තමා විසින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස අවුරුදු තුනක (03) කාලයක් තම ධුරය දැරිය යුතු අතර, ඒ සඳහා නැවත පත්කරනු ලැබිය හැක්කේ ය.

ඉවත්වන සාමාජිකයින් වෙනුවෙන් සාමාජිකයින් පත් කිරීම.

(7) රෝගීව සිටීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්යභාරය ඉටු කිරීමට යම් පත්කළ සාමාජිකයකු අපොහොසත් වන බව මණ්ඩලයේ බහුතර සාමාජිකත්වයේ තීරණය වන අවස්ථාවල දී ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැක්කේ ය.

(8) සෑම පත්කළ සාමාජිකයකු තම ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක දී ඔහුගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ධුරය දැරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය හැක්කේ ය.

කාර්ය පරිපාටි සෑදීම.

(9) මණ්ඩලයේ රැස්වීම්වලට සහ එම රැස්වීම්වල දී කටයුතු කරගෙන යාමට අදාළ කාර්ය පටිපාටි මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් සාදනු ලැබිය හැක්කේ ය.

මණ්ඩලයේ කටයුතු අවලංගු නොවන බව.

(10) මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ මණ්ඩලය පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවන් හෝ කටයුතු හෝ අවලංගු නොවන්නේ ය.

දීමනා ගෙවීම.

(11) සභා රැස්වීම් වාරයන්ට සහභාගිවන සාමාජිකයින්ට ඒ වෙනුවෙන් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලබන යම් දීමනාවක් ගෙවිය හැකි වන්නේ ය.

(12) මණ්ඩලය අවම වශයෙන් ලිත් මාස 02කට වරක්වත් රැස්විය යුතු ය. සභා රැස්වීම.

(13) සභා රැස්වීමක දී සනපූර්ණය සාමාජිකත්වයෙන් $^{1}/_{3}$ කට නොඅඩු විය යුතුය. සනපූර්ණය.

15. *දේශීය වෛද්‍ය උපදේශක මණ්ඩලයේ කාර්යභාරය :*

(1) වයඹ පළාතේ දේශීය වෛද්‍ය කටයුතු නංවාලීමට, විධිමත් කිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් වන කාර්යයන් හා කර්තව්‍යයන් නිශ්චය කිරීමට අමාත්‍යවරයාට ඒ පිළිබඳව යෝජනා කිරීම හා නිර්දේශ කිරීම. මණ්ඩලයේ කාර්ය භාරය.

(2) දේශීය වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමේ අදහසින් ආයුර්වේදයෙහි සියලුම අංශවල කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් ද, විශේෂයෙන්ම ආයුර්වේද සාහිත්‍ය, ආයුර්වේද ශාස්ත්‍රයෙහි මූලධර්ම, ආයුර්වේද චිකිත්සා, ආයුර්වේද ඖෂධ සංග්‍රහ යන කරුණු පිළිබඳව අවශ්‍ය කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් වන කාර්ය හා කර්තව්‍ය සම්පාදනය කිරීම, යෝජනා හා නිර්දේශ ලබාදීම.

(3) අමාත්‍යවරයා විමසනු ලබන පහත සඳහන් කරුණු ඇතුළු දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ කරුණු සම්බන්ධයෙන් යෝජනා, නිරීක්ෂණ, උපදෙස් හා නිර්දේශ ලබාදීම.

*(අ)* දේශීය වෛද්‍ය පුස්තකාල, කෞතුකාගාර, ඖෂධ නිධි, රසායනාගාර හා වෙනත් ආයතන පවත්වාගෙන යාම.

*(ආ)* ආයුර්වේද අත් පිටපත්, ආයුර්වේද ග්‍රන්ථ හා වෙනත් ආයුර්වේද සඟරා හෝ පොත් ප්‍රකාශය කිරීම.

*(ඇ)* ආයුර්වේද ඖෂධ ප්‍රචලිත කිරීම.

## **IV** වන කොටස

### ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටු

16. වයඹ පළාත තුළ ඇති ආයුර්වේද රෝහල්වල සංවර්ධන හා පුනරුත්ථාපන කටයුතු සහ ඒ හා සම්බන්ධ අනුෂාංගික කටයුතු මහජන සහභාගිත්වයෙන් යුතුව සිදුකිරීම සඳහා එම ආයතනයකට එකක් බැගින් රෝහල් සංවර්ධන කමිටු පිහිටුවා ගනු ලැබිය හැක්කේ ය. රෝහල් සංවර්ධන කමිටු පිහිටුවීම හා සංයුතිය.

කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

(*අ*) අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා,

(*ආ*) ආයතන භාර ආයුර්වේද වෛද්‍ය නිලධාරි සහ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි,

(*ඇ*) ප්‍රදේශය භාර පොලිස් ස්ථානාධිපති හෝ ඔහුගේ නියෝජිතයකු,

(*ඈ*) රෝහල පිහිටි වසම භාර ග්‍රාම නිලධාරිවරයා,

(*ඉ*) ආසන්නතම පාසලේ විදුහල්පති හෝ නියෝජිතයකු,

(*ඊ*) පළාත් පාලන ආයතනයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු,

(*උ*) පාරම්පරික වෛද්‍යවරු දෙදෙනෙකු,

(*ඌ*) රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින් සහ/හෝ ප්‍රදේශයේ ප්‍රභූවරුන් නියෝජනය කරමින් තිදෙනෙකු.

17. කමිටු රැස්වීමක් පවත්වාගෙන යාම සඳහා සාමාජිකයින් 07 දෙනෙකු සනපූර්ණය අවශ්‍ය වන්නේ ය. ගණපූරණය.

කමිටුවේ සභාපති හා ලේකම් සාමාජිකයින් පත් කිරීම.

18. i. ප්‍රාදේශීය ලේකම්වරයා කමිටුවේ සභාපති විය යුතු අතර, ආයතන භාර වෛද්‍ය නිලධාරීවරයා ලේකම් විය යුතු ය.

ii. ඉහත (18) වගන්තියේ (අ) සිට (ඊ) දක්වා සඳහන් වන අයට නිල බලයෙන් සාමාජිකත්වය හිමි වන්නේය.

iii. ඉහත (18) වගන්තියේ (උ) හා (ඌ) යටතේ සඳහන් සාමාජිකයින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර, මෙම පත් කරනු ලැබූ සාමාජිකයන් මින් මතු ''පත් කළ සාමාජිකයින්'' වශයෙන් හඳුන්වනු ලබන්නේ ය.

iv. කමිටුවේ සාමාජිකයින් අතරින් එක් අයෙකු භාණ්ඩාගාරිකවරයෙකු වශයෙන් පත්කර ගනු ලබන්නේ ය.

කාර්ය පරිපාටි සෑදීම.

19. කමිටුවේ රැස්වීම්වලට සහ ඒ රැස්වීම්වලදී කටයුතු කරගෙන යාමට අදාළ කාර්ය පරිපාටි හා රීති මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව, කමිටුව විසින් සාදනු ලැබ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

කමිටුවේ කාර්ය භාරය.

20. ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටුවේ කාර්යභාරය පහත සඳහන් වේ.

(1) රෝහලේ හෝ මධ්‍යම බෙහෙත් ශාලාවේ සේවා ප්‍රදේශය තුළ දේශීය වෛද්‍ය හා ආයුර්වේද වැඩසටහන් සැලසුම් කිරීම, යෝජනා කිරීම

(2) රෝහල සහ මහජනතාව, රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලයන් අතර සම්බන්ධීකරණය.

(3) ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටු අරමුදල පිහිටුවීම හා පවත්වාගෙන යාම

(4) රෝහල් සංවර්ධන කමිටු අරමුදල පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම

(5) දේශීය වෛද්‍ය ක්‍රම උපයෝගී කරගෙන ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා ගුණාත්මක සේවයක් සලසා දීමට සහාය වීම.

(6) රෝහල් හෝ මධ්‍යම බෙහෙත් ශාලාවල කටයුතු ප්‍රවර්ධනය කිරීම හා ප්‍රජා සෞඛ්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය යෝජනා / නිර්දේශ අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීම හා අනුමත යෝජනා ක්‍රියාවට නැංවීමට සහායවීම හා ක්‍රියාත්මක කිරීම.

21. දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලත් යෝජනා අරමුදල් තර කිරීම සඳහා ක්‍රියාත්මක කිරීම හා මෙම අරමුදලේ විගණනය පළාත් මූල්‍ය රීති සංග්‍රහයට ඇතුළත් 1987 අංක 42 දරන පනත අනුකූල වේ.

## V වන කොටස

### පොදු විධිවිධාන

නඩු පැවරීමේ බලය.

22. මෙම ප්‍රඥප්තියේ 30 වන වගන්තිය යටතේ යම් වරදක් සිදුකරනු ලැබූ විට නඩු පැවරීමේ බලය කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිළධරයකු හෝ සතු වන්නේ ය.

නියෝග පැනවීමේ බලය.

23. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන්නා වූ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග පනවනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලැබූ සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකොට දින 30 ක කාලයක් ඉකුත් වූ වහාම පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුත්තේ ය.

(3) පළාත් සභාව විසින් අනුමත කරනු ලැබූ යම් නියෝගයක් එකී නියෝග යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හානියක් නොවන පරිදි පරිච්න්න කරනු ලැබූ ලෙස සැලකිය යුත්තේ ය.

(4) යම් නියෝගයක් පරිච්න්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකල යුතු ය.

24. මෙම ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පිහිටුවන ලද ආයතන හා සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පළාතේ වාර්ෂික අයවැය ලේඛනයෙන් හා පළාත් සභා අරමුදලින් සහ රජය විසින් අනුමත කරනු ලබන වෙනත් ප්‍රභවයකින් ලබාදිය යුත්තේ ය. ප්‍රතිපාදන සැලසීම.

25. පළාත තුළ ජනගහන ව්‍යාප්තිය, භූමි ප්‍රමාණය, රෝග ව්‍යාප්තිය, පෝෂණ තත්වය, පාරිසරික බලපෑම් සහ ගමනාගමන පහසුකම් ආදිය පදනම් කරගෙන ස්ථිර හෝ තාවකාලික පදනම මත නව දේශීය වෛද්‍ය ආයතන ඇති කිරීම, දේශීය වෛද්‍ය පරිපාලන කොට්ඨාස ඇති කිරීම, ප්‍රතිසංවිධානය කිරීම කළ හැකිය. එම ප්‍රතිසංවිධාන අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකල යුත්තේ ය. දේශීය වෛද්‍ය ආයතන ඇති කිරීම හා කොට්ඨාස ප්‍රතිසංවිධානය කිරීම.

26. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව දැනට වයඹ පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශය යටතේ පවතින සියළුම දේශීය වෛද්‍ය ආයතන හා ඊට අදාළ සියලුම චංචල හා නිශ්චල දේපළ දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබුවා සේ සැලකිය යුත්තේ ය. වයඹ පළාත් සභාවේ දේශීය වෛද්‍ය ආයතන දෙපාර්තමේන්තුව වෙත පැවරීම,

27. පළාත තුළ ඇති පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව අවශ්‍ය දේශීය වෛද්‍ය කටයුතු කිරීමට කොමසාරිස්වරයා හට බලය ඇති අතර, එම ප්‍රදේශ තුළ සෞඛ්‍ය තත්වය පිළිබඳ විස්තර වාර්තාවක් අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කරන ලෙස, අදාල පළාත් පාලන බලධාරීන්ගෙන් ඉල්ලා සිටිය හැක්කේ ය. පළාත් පාලන බල ප්‍රදේශ තුළ සෞඛ්‍ය කටයුතු.

28. කොමසාරිස්වරයා විසින් මෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු කාරණාවලට අදාළ වාර්තා හෝ තොරතුරු ලිඛිත දැනුම්දීමකින් නිශ්චිතව දක්වනු ලබන සාධාරණ කාලසීමාවක් තුළදී තත් කාර්ය සඳහා නිසි පරිදි බලය පවරන ලද නිලධරයා වෙත සපයන ලෙස යම් තැනැත්තෙකුට ලිඛිතව නියම කරනු ලැබිය හැක්කේ ය. තොරතුරු ලබාදිය යුතු බව.

29. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුවම වූ දිනයෙහි දේශීය වෛද්‍ය විෂය ක්‍රියාත්මක කිරීම උදෙසා යම් ආකෘතියක්, දැන්වීමක්, බලපත්‍රයක්, ලේඛණයක් හෝ එවැනි ලියවිල්ලක් භාවිත කළ යුතු යැයි නියම කර තිබුනේ නම්, එම ආකෘතිය, දැන්වීම, බලපත්‍රය, ලේඛණය හෝ ලියවිල්ල මෙම ප්‍රඥප්තිය යටතේ නියම කරන ලද එකක් සේ සැලකිය යුත්තේ ය. අන්තර්කාලීන විධිවිධාන.

## VI වන කොටස

## වැරදි හා දණ්ඩන

30. (1) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් යටතේ හෝ සාදන ලද හෝ සපයනු ලබන හෝ යම් වාර්තාවක හෝ වෙනත් ලේඛණයක් මත දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන්නාවූ තැනැත්තෙක් ද, වැරදි.

(2) මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ තැනැත්තෙක්ද,

(3) කොමසාරිස්වරයාගේ නියෝග හෝ නිවේදන සාධාරණ හේතුවකින් තොරව පැහැර හරින්නා වූ තැනැත්තෙක්ද,

(4) මෙම ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ පනවන ලද යම් නියෝගයක් යටතේ හෝ එමගින් යම් තැනැත්තෙකු වෙත පැවරී ඇති හෝ පවරනු ලැබ ඇති යම් බලතල කර්තව්‍ය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී ඒ තැනැත්තාට අවහිර හෝ බාධා කරන්නා වූ සෑම තැනැත්තෙක් ද,

(5) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ පනවන ලද යම් නියෝගයක් හා විධිවිධානයක් හෝ කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම චුවමනාවෙන්ම පැහැර හරින <u>සහ/හෝ</u> චුවමනාවෙන්ම අවහිර කරන අයෙකු ද,

මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

දඬුවම්.

31. මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදුකරනු ලබන සෑම තැනැත්තෙකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු වුවහොත්, රුපියල් විසිදහසක් (රුපියල් 20,000.00) නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් (3) නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළ යුතු වන්නේ ය.

## VII වන කොටස

### අර්ථ නිරූපනය

මෙම ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අවශ්‍ය වන්නේනම් මිස,

32. ''පළාත් සභාව'' - යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

''පළාත'' - යන්නෙන් කුරුණෑගල සහ පුත්තලම යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වයඹ පළාත ද,

''ආණ්ඩුකාරවරයා'' - යන්නෙන්, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා ද,

''අමාත්‍ය මණ්ඩලය'' - යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය ද,

''අමාත්‍යවරයා'' - යන්නෙන්, වයඹ පළාතේ පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයා ද,

''ලේකම්'' - යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂයභාර අමත්‍යාංශයේ ලේකම්වරයා ද,

''ඖෂධ'' යන්නෙන් දේශීය ආයුර්වේද, සිද්ධ, යුනානි හා පාරම්පරික නමින් අදහස් වන්නේ ය.

''කොමසාරිස්'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ද,

''පළාත් පාලන ආයතන'' යන්නෙන් වයඹ පළාතේ මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා ද,

''දේශීය වෛද්‍ය'' යන්නෙන්, ආයුර්වේද, සිද්ධ, යුනානි සහ පාරම්පරික වෛද්‍ය ක්‍රම ද,

''ආනුෂංගික අනෙකුත් සේවාවන්'' යන්නෙන්, - ජ්‍යෝතිෂ ශාස්ත්‍රය, භූත වෛද්‍ය ක්‍රම ද, සත්ත්ව සහ වෘක්ෂ වෛද්‍ය ක්‍රම ද, කටු චිකිත්සා සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය,

''දේශීය වෛද්‍ය ආයතන'' - යන්නෙන්, දේශීය වෛද්‍ය සේවා සපයනු ලබන සියලුම ආයතන ද,

''මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා ''දේශීය වෛද්‍ය ආයතන'' - යන්නෙන්, රෝහල, ප්‍රතිකාර මධ්‍යස්ථාන හෝ බෙහෙත් ශාලා, නිකේතන, සම්භාහන මධ්‍යස්ථාන, ඔසු සල, ඔසු උයන් හා ඔසු තවාන්, අළෙවි සැල්, නිෂ්පාදනාගාර, විලවුන් හා ඖෂධ නිෂ්පාදනාගාර, උපදේශන සේවා මධ්‍යස්ථාන, ආයුර්වේද රූපලාවන්‍යාගාර සහ ආයුර්වේද නමින් පවත්වාගෙන යනු ලබන ඕනෑම ආයතනයක් ආදිය ද,''

''දේශීය වෛද්‍ය හා පාරම්පරික වෛද්‍යවරුන්'' - යන්නෙන්, ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සහ නැති වයඹ පළාතේ සේවා සපයන සියලුම පාරම්පරික, ආයුර්වේද, සිද්ධ, යුනානි, හෝමියෝපති වෛද්‍යවරුන් ද අදහස් කෙරේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

33. මේ පනතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

03-296/2

## වයඹ පළාත් සභාව

### වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක ........ දරන වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය

මෙහි පහත පළකරන වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක ............. දරන වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රඥප්තිය අද දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසුව වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳ ඉදිරිපත් කිරීමට යම් කරුණක් ඇතොත් එය එදිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ලක්ෂ්මන් වේඩරුව,<br>
අමාත්‍ය,<br>
වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,<br>
සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා,<br>
කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය.

වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,<br>
සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා,<br>
කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය.<br>
3 වෙනි මහල,<br>
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,<br>
කුරුණෑගල.

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව

සෞඛ්‍ය සේවා ප්‍රඥප්ති කෙටුම්පත - 2017

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 11 වන කාරණය වූ සෞඛ්‍යය විෂයට අදාළ වූ මෙම ප්‍රඥප්තිය; වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විධිමත්ව ස්ථාපිතකර එමගින් පළාතේ සෞඛ්‍ය සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම සහ තහවුරු කිරීම පිණිස වේ.

1. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාත් සභාවේ ............ වර්ෂයේ අංක ....... දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය ලෙස හැඳින්වෙන අතර, පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින හෝ ආණ්ඩුකාරවරයා විසින් නියම කරනු ලබන්නා වූ දිනක සිට මෙම ප්‍රඥප්තිය බලපැවැත් වේ. *(ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීම.)*

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත පරිදි වේ. *(අරමුණු.)*

2. (1) වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විධිමත්ව ස්ථාපිත කිරීම මගින් ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව ආයතන පාදක හා ප්‍රජා පාදක ක්‍රමවේදයන් මගින් පළාත තුළ වෛද්‍ය සේවාවන්, නිවාරක සෞඛ්‍ය සේවාවන් සහ සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාවන් සැපයීම.

2. (2) දෙපාර්තමේන්තුවේ සේවා සැපයීම සඳහා ආධාරයක් වීම සඳහා රෝහල් සංවර්ධන කමිටු පිහිටුවීම.

2. (3) වයඹ සෞඛ්‍ය සංවර්ධන අරමුදල පිහිටුවීම.

## I වැනි කොටස

*පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විධිමත්ව ස්ථාපිත කිරීම, එහි සංයුතිය, බලතල සහ කාර්යභාරය*

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විධිමත්ව ස්ථාපිත කිරීම.

3. වයඹ පළාත සඳහා වූ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව (මින්මතු පළාත් දෙපාර්තමේන්තුව ලෙස සඳහන් කරනු ලබන) මෙම ප්‍රඥප්තිය මගින් විධිමත් ලෙස ස්ථාපිත කෙරේ.

පළාත් දෙපාර්තමේන්තු-වේ කාර්ය භාරය.

4. (අ) පළාත් දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ (මින් මතු රේඛීය අමාත්‍යාංශය ලෙස සඳහන් කරනු ලබන) සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තාක්ෂණික උපදෙස් මත පළාත් සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම්වරයාගේ පරිපාලන උපදෙස්වලට යටත්ව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ, පළාත් සභා ලැයිස්තුවේ 11 වන කාරණය යටතේ වූ අංගයන් සඳහා වයඹ පළාත තුළ සෞඛ්‍ය සේවාව ලබාදෙනු ඇත.

4. (ආ) පළාත් දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් ක්ෂේත්‍රයන් ආවරණය කරමින් (එයට සීමා නොවී) සේවාවන් ලබාදෙනු ඇත්තේ ය.

- රෝහල් මගින් සේවාලාභීන් සඳහා නේවාසික රෝග කළමනාකරණ සේවා
- රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක මගින් සේවාලාභීන් සඳහා බාහිර අංශයේ සායන සේවා
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සහ එම කාර්ය මණ්ඩලය මගින් ප්‍රජා සෞඛ්‍ය සේවා සහ පාරිසරික සෞඛ්‍ය සේවා

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක සහ එම ධුරයේ කාර්යභාරය.

5. (1) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා මින් මතු පළාත් අධ්‍යක්ෂ ලෙස සඳහන් කරනු ලබන) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ය. පළාත් අධ්‍යක්ෂක තනතුර ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවාවේ ව්‍යවස්ථාව සහ එහි පටිපාටිවලට අනුකූලව එම සේවාවේ ජ්‍යෙෂ්ඨ පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු විසින් හොබවනු ඇත. මෙම නිලධාරියා පළාත් ලේකම්වරයාට වාර්තා කළයුතු අතර සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තාක්ෂණික මගපෙන්වීම්වලට අනුගතව තනතුරේ රාජකාරි ඉටුකළ යුතු වන්නේ ය.

(2) පළාත් අධ්‍යක්ෂකට හිමි යම් බලතල දෙපාර්තමේන්තුවේ සුදුසු නිලධාරින්ට පැවරීමට පළාත් අධ්‍යක්ෂකට බලය ඇත.

(3) අදාළ රෙගුලාසි සහ ප්‍රමිතීන්ට අනුව පළාත් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලීන් ප්‍රතිසැලසුම් කිරීම හා ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ බලතල පළාත් අධ්‍යක්ෂකවරයාට ඇත්තේ ය.

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු.

6. එක් එක් සෞඛ්‍ය සේවා ප්‍රදේශයකට පත්කරනු ලබන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා (මින් මතු ''ප්‍රාදේශීය අධ්‍යක්ෂක" වශයෙන් හැඳින්වෙන) පළාත් අධ්‍යක්ෂක වෙත වාර්තා කළ යුත්තේ ය. මෙම තනතුරු ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවාවේ ව්‍යවස්ථාව සහ අදාළ පටිපාටිවලට යටත්ව එම සේවාවේ ජ්‍යෙෂ්ඨ පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු විසින් හොබවනු ඇත.

සෞඛ්‍ය සේවා ආයතන පරීක්ෂා කිරීමේ අධිකාරි බලය.

7. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත් අධ්‍යක්ෂවරයාට ප්‍රාදේශීය අධ්‍යක්ෂවරුන්ට සහ එම අධ්‍යක්ෂවරයෙකු විසින් නීත්‍යානුකූල ලෙස අධිකාරි බලය ලබාදී ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරියෙකු පළාත් දෙපාර්තමේන්තුවේ ඕනෑම ආයතනයකට ඇතුල්වීම හා පරීක්ෂා කිරීමට අධිකාරි බලය ඇත්තේ ය.

(2) එවැනි කිසිම නිලධාරියෙකු විසින් සේවාලාභීන්ගේ පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය පිළිබඳ අයිතිය සහ ඊට අදාළ ආචාරධර්ම උල්ලංඝනය නොකළ යුතු ය. මෙම නිලධාරින්ට අධිකරණ නියෝගයක් හෝ වෛද්‍ය ආචාරධර්ම කමිටු අනුමැතියකින් තොරව සේවාලාභීන්ගේ පෞද්ගලික සෞඛ්‍ය තොරතුරු සහිත ලේඛන ලබාගැනීමට හෝ පරීක්ෂා කිරීමට අධිකාරි බලයක් නොමැත්තේ ය.

පළාතේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ වාර්ෂික වාර්තාව.

8. පළාත් අධ්‍යක්ෂවරයා විසින් පළාතට අදාළව පෙර ලිත් වර්ෂයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවක් ඊළඟ ලිත් වර්ෂය ඇතුළත පළාත් සෞඛ්‍ය ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය. එකී වාර්තාවට පෙර වර්ෂයේ

සෞඛ්‍ය සේවා සැපයීමේ සාර්ථකත්වය සහ එහි දුර්වලතා පිළිබඳ සංඛ්‍යාලේඛන සහ ඒ පිළිබඳව ඔහුගේ නිරීක්ෂණ හා නිර්දේශ ද අඩංගු විය යුතු ය. මෙම වාර්තාවල නිශ්චිතව කිසිදු තැනැත්තෙකුගේ රෝග තත්ත්ව හෝ සෞඛ්‍යය හා සබැඳි තොරතුරු ඇතුලත් නොවිය යුත්තේ ය.

9. (1) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතන බල ප්‍රදේශවලින් ඉටු කෙරෙන සෞඛ්‍ය හා සබැඳි කටයුතු සඳහා සේවා සඳහා තාක්ෂණික උපදෙස් සහ මගපෙන්වීම් ලබාදිය යුතු ය. පළාත් පාලන ආයතන විසින් ලබාදෙන සෞඛ්‍යය හා සබැඳි සේවා.

(2) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දත්ත, විස්තර හෝ තොරතුරු ඇතුළු කරන්නාවූ, විශ්ලේෂණය කරන්නාවූ හෝ ගබඩා කරන්නාවූ තොරතුරු පද්ධතිවලට අදාළ දත්ත, විස්තර හෝ තොරතුරු පළාතේ සියළු පළාත් පාලන ආයතන වලින් ලබා ගත යුතු ය.

10. පළාත් දෙපාර්තමේන්තුවේ මුදල් වර්ෂය වන්නේ ලිත් වර්ෂයයි. පළාත් දෙපාර්තමේන්තුවේ පරිපාලන හා සංවර්ධන කටයුතු කරනු ලබන්නේ පළාත් සභාවේ මුදල් ප්‍රකාශයෙන් වෙන්කෙරෙන මූල්‍ය ප්‍රතිපාදන, අවශ්‍ය විටෙක ඉදිරිපත් කෙරෙන පරිපූරක ඇස්තමේන්තු, අදාල රේඛීය අමාත්‍යංශ ප්‍රතිපාදන හා අනෙකුත් ප්‍රභවයන් ද ප්‍රතිපාදන ලබාගත හැක. මූල්‍ය කටයුතු.

11. පළාත් දෙපාර්තමේන්තුවේ සියළුම මූල්‍ය කටයුතු වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට අනුකූලව සිදුකල යුත්තේ ය.

## II වැනි කොටස

*රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක සඳහා සංවර්ධන කමිටු*

12. තම රෝහල හෝ ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය සඳහා සංවර්ධන කමිටු පිහිටුවීමට ආයතන ප්‍රධානියාට බලතල ඇත්තේ ය. සංවර්ධන කමිටු පිහිටුවීම.

13. (1) බහු විධ හා මහජන සහභාගීත්වය මගින් පළාත් දෙපාර්තමේන්තුවේ පිහිටි එක් එක් රෝහලේ හෝ ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ භෞතික සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය සඳහා සහාය වීම සංවර්ධන කමිටුවක අරමුණ වන්නේ ය. සංවර්ධන කමිටුවක අරමුණු.

13. (2) සෞඛ්‍ය සත්කාර සේවා සහ ආයතනයේ අභ්‍යන්තර පරිපාලන කටයුතු සඳහා මැදිහත් වීමට මෙම කමිටු ක්‍රියා නොකල යුත්තේ ය.

14. ආයතන ප්‍රධානී වෛද්‍ය නිලධාරිවරයා නිල බලයෙන් කමිටුවේ සාමාජිකයෙකු සහ කමිටුවේ සභාපති වන්නේ ය. සංවර්ධන කමිටුවක සංයුතිය.

15. ලේකම්වරයා ලෙස කමිටු සාමාජිකයෙකු කමිටුව විසින් තෝරා පත්කරගත යුතු ය.

16. කමිටුවේ නම් කළ සාමාජිකයන්ගේ නිල කාලය අවුරුදු දෙකකට සීමා වනු ඇත.

17. (1) මූලික රෝහල් සහ ප්‍රාදේශීය රෝහල් සඳහා කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය යුත්තේ ය.

17. (2) අදාළ ප්‍රදේශය නියෝජනය කරන්නා වූ පළාත් සභා මන්ත්‍රීවරු, පළාත් පාලන ආයතන ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා කමිටුවේ අනුශාසකවරුන් වශයෙන් නිල බලයෙන් පත්වන්නේ ය.

17. (3) කමිටුව සඳහා පහත සඳහන් පුද්ගලයන් පත් කෙරෙනු ඇත :-

නිල බලයෙන් පත්වන සාමාජිකයෝ

- රෝහල ප්‍රධාන වෛද්‍ය නිලධාරි
- අදාළ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
- අදාළ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරිවරයා

නම් කළ සාමාජිකයෝ ඃ

- රෝහල් කාර්ය මණ්ඩලයේ විවිධ සේවා කණ්ඩායම්වලට අයත් නියෝජිතයින් තිදෙනෙක් (තම සේවක මණ්ඩලය සමඟ සාකච්ඡා කර රෝහලේ ප්‍රධානියා විසින් තෝරා ගනු ලැබේ.),
- ප්‍රදේශයේ සෞඛ්‍ය හා සමාජසේවා ක්‍රියාකාරකම්වල නිරත වන පුද්ගලයන් තිදෙනෙක්,
- ප්‍රදේශයේ රජයේ ආයතනවල සේවයේ නියුතු මාණ්ඩලික සේවයේ නිලධාරීන් දෙදෙනෙක්.

18. (1) ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි විය යුත්තේ ය.

18. (2) අදාළ පළාත් පාලන ආයතන ප්‍රධානියා සහ අදාළ ප්‍රදේශය නියෝජනය කරන්නා වූ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරු කමිටුවේ අනුශාසකවරුන් වශයෙන් නිල බලයෙන් පත්වන්නේ ය.

18. (3) කමිටුව සඳහා පහත සඳහන් පුද්ගලයන් පත් කෙරෙනු ඇත ඃ

නිල බලයෙන් පත්වන සාමාජිකයෝ ඃ

- රෝහල ප්‍රධාන වෛද්‍ය නිලධාරී ;
- අදාළ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ;
- අදාළ ග්‍රාම නිලධාරිවරයා.

නම්කළ සාමාජිකයෝ ඃ

- රෝහල් කාර්ය මණ්ඩලයේ විවිධ සේවා කණ්ඩායම්වලට අයත් නියෝජිතයින් දෙදෙනෙක් (තම සේවක මණ්ඩලය සමඟ සාකච්ඡා කර රෝහලේ ප්‍රධානියා විසින් තෝරාගනු ලැබේ.),
- ප්‍රදේශයේ සෞඛ්‍ය හා සමාජසේවා ක්‍රියාකාරකම්වල නිරතවන පුද්ගලයන් තිදෙනෙක්,
- ආසන්න ආගමික ස්ථාන නියෝජනය කරමින් පූජ්‍ය පක්ෂයේ දෙදෙනෙක්,
- ප්‍රදේශයේ රජයේ ආයතනවල සේවයේ නියුතු මාණ්ඩලික සේවයේ නිලධාරීන් දෙදෙනෙක්.

මහා සභා රැස්වීම් සහ ගිණුම් වාර්තා

19. සෑම ලිත් වර්ෂයකම මහා සභා රැස්වීම් (වාර්ෂික හෝ විශේෂ) වාර්තා සහ ගිණුම් වාර්තාව කමිටුව විසින් ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරයා වෙත කමිටුවේ ලේකම්වරයාගේ සහ සභාපතිවරයාගේ අත්සන්වලින් යුතුව ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතු වන්නේ ය.

## III වැනි කොටස

### වයඹ සෞඛ්‍ය සංවර්ධන අරමුදල

අරමුදල පිහිටුවීම

20. වයඹ සෞඛ්‍ය සංවර්ධන අරමුදල නමින් අරමුදලක් ආරම්භ කොට පවත්වාගෙන යා යුතු වන්නේ ය. (මින් මතු ''අරමුදල''නමින් සඳහන් කරනු ලබන).

භාරකාර මණ්ඩලය.

21. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය හා පාලනය මෙමගින් ස්ථාපිත කරනු ලබන වයඹ සෞඛ්‍ය අරමුදල් භාරකාර මණ්ඩලයට (මින් මතු ''භාරකාර මණ්ඩලය'"යනුවෙන් සඳහන් කරනු ලබන) පැවරෙන්නේ ය.

21. (2) භාරකාර මණ්ඩලය නිල බලයෙන් පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත විය යුතු ය ඃ

- පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්,
- පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය),
- පළාත් අධ්‍යක්ෂ,
- ප්‍රාදේශීය අධ්‍යක්ෂකවරුන්,
- පළාත් අමාත්‍යාංශයේ ගණකාධිකාරී,
- පළාත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී,
- පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයේ විශේෂඥ ප්‍රජා වෛද්‍ය (සැලසුම්),
- පළාත් අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්).

21. (3) අරමුදලේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික තනතුරු සඳහා පිළිවෙලින් පළාත් සෞඛ්‍ය ලේකම්වරයා, පළාත් අධ්‍යක්ෂවරයා සහ පළාත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීවරයා නිල බලයෙන් පත්වන්නේ ය.

21. (4) භාරකාර මණ්ඩලයේ රැස්වීම් සඳහා සණ පූරණය අරමුදලේ සභාපති හෝ ලේකම් ඇතුළත්ව පස් (5) දෙනෙකු විය යුත්තේ ය.

22. මෙම අරමුදල වයඹ පළාත් මුදල් රීති සංග්‍රහයට අනුකූලව ක්‍රියාත්මක විය යුතු ය.

23. තනි පුද්ගලයින්ගෙන්, ආයතන හා සංවිධාන වෙතින් ලැබෙන පරිත්‍යාග අරමුදලේ ගිණුමට බැර කෙරෙනු ඇත. පළාතේ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම වෙනුවෙන් පළාත් අමාත්‍යාංශය හෝ පළාත් දෙපාර්තමේන්තුව මැදිහත්ව විවිධ ක්‍රියාකාරකම් මගින් උපයාගත් මුදල් ද මෙම අරමුදලට බැරකළ යුත්තේ ය. අරමුදලට ලැබීම්.

24. පළාත් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශයට සහ භාරකාර මණ්ඩලයේ සභාපතිවරයාගේ අනුමැතියට යටත් ව අරමුදලට අයත් මුදල් පහත සඳහන් ඕනෑම අරමුණක් වෙනුවෙන් යොදා ගැනීම මණ්ඩලයේ වගකීම වන්නේ ය. එනමුත් යම්කිසි නිශ්චිත කටයුත්තක් වෙනුවෙන් පරිත්‍යාගයක් ලැබුණු විටෙක එවැනි පරිත්‍යාගයක් ප්‍රායෝගිකව කළ හැකි උපරිම ආකාරයෙන් එම අරමුණ සඳහාම යෙදවීමට වග බලාගත යුතු වේ : අරමුදලේ ප්‍රතිපාදන යොදා ගත හැකි කාර්යයන්.

I. පළාත් දෙපාර්තමේන්තුවේ රෝහලක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක හෝ ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයක භෞතික සම්පත් සංවර්ධනයට සහ යටිතල පහසුකම් සැපයීම සඳහා,
II. පළාත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදුකරන පළාතට අදාළ පර්යේෂණ ප්‍රවර්ධනය සහ ඔවුන්ගේ වෘත්තීමය දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා,
III. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශ කරන්නා වූ පළාතේ ජනයාට විශේෂයෙන් බලපාන්නා වූ රෝග වැළැක්වීම හා සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා වූ වැඩ කටයුතු සඳහා.

25. අරමුදලට අයත් මුදල් ආණ්ඩුවට අයත් බැංකුවක පමණක් තැන්පත් කළ යුත්තේ ය. අරමුදලේ මුදල් තැන්පත් කිරීම.

26. භාරකාර මණ්ඩලයේ භාණ්ඩාගාරික විසින් අරමුදලේ ආදායම් හා වියදම් පිළිබඳ විධිමත් ලෙස ගිණුම් පවත්වාගෙන යා යුතු ය. අරමුදලේ ගිණුම් සහ විගණනය.

## IV වැනි කොටස

### රෙගුලාසි පැනවීම

27. මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන කරුණකට අදාළව රෙගුලාසි පැනවීමක් අවශ්‍ය වුවහොත් පළාත් අධ්‍යක්ෂක හා පළාත් සෞඛ්‍ය ලේකම් විසින් නිර්දේශ කරනු ලබන රෙගුලාසි පැනවීම පළාත් අමාත්‍යවරයා විසින් විධිමත් ව සිදුකළ යුත්තේ ය. රෙගුලාසි පැනවීම.

28. මෙම වගන්තිය යටතේ පළාත් සභාව මගින් අනුමත කරන ලද රෙගුලාසි, ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ කළයුතු අතර, එසේ පළකරන ලද දින සිට හෝ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන පසුව යෙදෙන දිනක සිට එම රෙගුලාසි බලපැවැත්වෙනු ඇත.

## V වැනි කොටස

### අන්තර්කාලීන විධිවිධාන

29. පළාත් දෙපාර්තමේන්තු යටතට ගැනෙන ආයතනවල මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පෙර දිනට අනුමත තනතුරුවල විධිමත් පත්වීම් දරන සියළුම කාර්ය මණ්ඩල එදින සිට හා එදිනට පසු ඔවුන්ගේ පවතින පත්වීම් විධානයන්ටම සහ සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියාත්මක වන නිලධාරීන් හා සේවකයන් ලෙස සැළකෙනු ඇත. අන්තර්කාලීන විධිවිධාන.

30. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පෙර දිනට පළාත් දෙපාර්තමේන්තුව හෝ යටතේ ක්‍රියාත්මක සියලුම ආයතන හා ඒවායේ නිශ්චල හා චංචල දේපොළ එදින සිට මෙම ප්‍රඥප්තිය යටතේ විධිමත්ව ස්ථාපිත කළ පළාත් දෙපාර්තමේන්තුවට පවරා දී ඇති ලෙස සැලකේ.

## VI වැනි කොටස

### වෙනත්

භාෂා පාඨ අතර වෙනස්කම්.

31. ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ පිටපත් සහ ඉංග්‍රීසි පරිවර්තනයේ පාඨයන්හි භාෂා අතර අනනුකූලතාවයක් පැනනැගි අවස්ථාවලදී මුල් ප්‍රඥප්තිය සකස්කලා වූ සිංහල භාෂා පාඨයන් බලපැවැත්වෙනු ඇත.

අර්ථ නිරූපණය.

32. අර්ථය අන් අයුරකින් දක්වා නොමැති සෑම අවස්ථාවකදීම මෙම ප්‍රඥප්තියේ දී වලංගු වන අර්ථ දැක්වීම් පහත දැක්වෙන පරිදි වේ -

"පළාත් දෙපාර්තමේන්තුව" යන්නෙන් අදහස් කරන්නේ වයඹ පළාතේ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වේ.

"රේඛීය අමාත්‍යාංශය" ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය වේ.

''පළාත් අමාත්‍යවරයා'' යන්නෙන් අදහස් කරන්නේ වයඹ පළාත් අමාත්‍ය මණ්ඩලයේ සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා වේ.

''පළාත් අමාත්‍යාංශය'' යන්නෙන් අදහස් කරන්නේ වයඹ පළාතේ පළාත් සභාවේ සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය වේ.

''රේඛීය අමාත්‍යාංශය'' යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සෞඛ්‍ය විෂයය ඇතුලත් වන අමාත්‍යාංශය වේ.

''පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්'' යන්නෙන් අදහස් කරන්නේ වයඹ පළාත් සභාවේ සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

''පළාත් අධ්‍යක්ෂක'' යන්නෙන් අදහස් කරන්නේ වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වේ.

''ප්‍රාදේශීය අධ්‍යක්ෂක'' යන්නෙන් අදහස් කරන්නේ, වයඹ පළාතේ, එක් එක් සෞඛ්‍ය සේවා දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවා පරිපාලනය භාරව සිටින දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වේ.

''ලේඛන'' යන්නෙන් කඩදාසි ලේඛන පමණක් නොව විද්‍යුත් මාධ්‍යයෙන් ඇති ලේඛන, දත්ත, දත්ත සංචිත සහ තොරතුරු ද අදහස් වේ.

03-296/1

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2017

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.08.26 දිනැති *ගැසට් පත්‍රයේ* අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව මෙම තනතුරට දැනටමත් අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.)

02. 2.1 මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා. ප. ච. 03/2016 අනුව රු. 31,490-10 x 445-11 x 660-10 x 730-5 x 750-රු. 54,250/- වේ. (MN 4-2016). (රා. ප. ච. 3/2016 හා විධිවිධාන අනුව වැටුප් ගෙවීම කෙරෙනු ඇත.)

2.2 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2017.04.07 දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් 2017.04.07 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතු යි.

03. *පොදු සුදුසුකම් :*

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
(ආ) යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක අඛණ්ඩ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
(ඉ) වයස් සීමාව වයස අවු. 18ට නොඅඩු හා අවු. 35ට නොවැඩි විය යුතු ය.

04. *සේවා කොන්දේසි :* මෙම තනතුර ස්ථිර ය. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය සහ රජය විසින් පනවනු ලබන සේවා කොන්දේසි වලට යටත් වේ.

05. *සුදුසුකම් :*

5.1 අධ්‍යාපන සුදුසුකම් :

5.1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම.

06. *බඳවා ගැනීම ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මෙම තරග විභාගය විෂයයන් 02කින් සමන්විත ප්‍රශ්න පත්‍ර 02කින් යුක්ත වන අතර, සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40%ක් ලබා ගත යුතු වේ.

6.1 *ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :*

1. අභියෝගතා පරීක්ෂණය - කාලය පැය 01 යි, ලකුණු 100
   අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන හැකියාව, ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

2. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි, ලකුණු 100
   ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජීය, සංස්කෘතික, විද්‍යාත්මක හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන්නාවූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

07. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

7.1 විභාග ගාස්තුව රු. 400 කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට

බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.2 අයදුම්පත්‍රය මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2017.04.07 දිනට හෝ ඊට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ. ප.) අංක 109, කෙලින් වීදිය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2017'' යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මඟින් එවිය යුතුය.) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.3 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය වන/නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2017 පෙබරවාරි මස 15 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2017*

විභාග අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමඟ නම :..........................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..........................................................

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල : [ ] දෙමළ : [ ]
(අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

03. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

(i) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................

(ii) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :..........................................................

(iii) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - (අදාළ කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

කොළඹ [ ] ගම්පහ [ ] කළුතර [ ]

(iv) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.04.07 වැනි දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය

වර්ෂ :.................., මාස :.................., දින :..................

(v) දුරකථන අංකය :......................................................................

04. උපන් දිනය : වර්ෂය :.................. මාසය :.................. දිනය :..................

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2017.04.07 වැනි දිනට වයස :

වර්ෂ :.................., මාස :.................., දින :..................

05. ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුල "✓" ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

06. අධ්‍යාපන සුදුසුකම් :

(i) ලබා ඇති උපාධිය :..........................................................................................................................................

(ii) උපාධියේ දී හදාරන ලද ප්‍රධාන විෂයයන් :.........................................................................................................

(iii) විශ්ව විද්‍යාලයේ නම :.......................................................................................................................................

(iv) උපාධි සහතිකය වලංගු දිනය :...................................................................................
(උපාධි සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය.)

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :..................................................................................

දිනය :..............................................................................................

ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :.................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
| --- |

.................................................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකිබව මම හොඳාකාරවම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන වන බව ප්‍රකාශ කරමි.

.............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ...................................... දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම :.................................................................
තනතුර හා නිල මුද්‍රාව :........................................................................ අත්සන :.............................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සමාදාන විනිශ්චයකාරවරයකු දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥයකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු හෝ වර්ෂයකට රු. 2,40,360/ නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් සහතික කළ යුතුයි.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**
(අනවශ්‍ය වචන කපා හරින්න.)

............................................................................ මයා/මිය/මෙනවිය දැනට........................................................ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ආයතනයේ .......................................................... වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහු/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

...................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

දිනය :..............................

03-274

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.